# ඉන්ධන සැපයුම

වික්ටෝරියාව තුළ ඉන්ධන සැපයුම ස්ථාවරව පවතින අතර සාමාන්‍ය ඉල්ලුම සපුරාලීමට ප්‍රමාණවත් ඉන්ධන තිබේ.

වැඩි ඉල්ලුම හෝ සැපයුම් දාමයේ බලපෑම හේතුවෙන් සමහර ප්‍රදේශවල තාවකාලික බාධා ඇති විය හැකිය. රජය සහ කර්මාන්ත අංශය විසින් ක්‍රියාකාරී ලෙස තත්ත්වය අධීක්ෂණය කරමින් සිටී.

## ඔබ කළ යුත්තේ කුමක්ද

- ඔබට සාමාන්‍යයෙන් අවශ්‍ය ඉන්ධන පමණක් මිලදී ගන්න.
- දිගු ගමන් යාමට පෙර, කල්තියා සැලසුම් කර ඉන්ධන පුරවා ගන්න. විශේෂයෙන්ම ඔබ රැකියාවට යාම හෝ අත්‍යවශ්‍ය ගමන් සඳහා ඉන්ධන මත විශ්වාසය තබන්නේ නම්.
- තත්ත්වයන් වෙනස් වුවහොත්, යාවත්කාලීන කිරීම් සඳහා මෙම පිටුව පරීක්ෂා කරන්න.

## වික්ටෝරියානුවන් හට උදව් කළ හැක්කේ කෙසේද

ඉන්ධන මිල සහ ඉන්ධන ලබා ගැනීමේ හැකියාව පිළිබඳව බොහෝ දෙනා සිත්තැවුලට පත්ව සිටින බව අපි දනිමු. සෑම කෙනෙකුටම ඉන්ධන ලබා ගත හැකි බව සහතික කිරීම සඳහා සරල පියවර උපකාරී විය හැකිය.

## කල්තියා සැලසුම් කරන්න

- කිසිවෙකුටත් ඉන්ධන නොමැතිව සිටීමට සිදු නොවන පරිදි, ඔබට සාමාන්‍යයෙන් අවශ්‍ය ප්‍රමාණය පමණක් මිලදී ගන්න.
- ඔබ පිටත්ව යාමට පෙර, ඉන්ධන පුරවා ගන්න. විශේෂයෙන් ඔබ රැකියාවට යාම, පාසලට යාම හෝ ගමන් බිමන් සඳහා ඉන්ධන මත විශ්වාසය තබන්නේ නම්.

## ගමන් යාමට පෙර මිල ගණන් පරීක්ෂා කරන්න

- ඔබට ආසන්න ස්ථානවල ඉන්ධන මිල ගණන් පරීක්ෂා කිරීමට Service Victoria යෙදුමේ ඇති Servo Saver භාවිතා කරන්න.
- ඉන්ධන ලාභම ස්ථානය කොතැනදැයි ඔබට දැකගත හැකි අතර ඉන්ධන පිරවිය යුත්තේ කවදාදැයි සැලසුම් කරගත හැකිය.

## ඉන්ධන හා සේවා සැපයුම්හල් වලදී කාරුණික වන්න

- කාර්යබහුල සහ ආතතිය ගෙන දෙන කාලයකදී, ඉන්ධන හා සේවා සැපයුම්හල්වල කාර්ය මණ්ඩලය ඔවුන්ගේ උපරිම සේවය ඉටු කරමින් සිටී.
- ඔබේම සේවා ස්ථානයේදී ඔබ හැසිරීමට බලාපොරොත්තු වන ආකාරයටම, කරුණාකර ඉන්ධන හා සේවා සැපයුම්හල් සේවකයින්ට ඉවසීමෙන් සහ ගෞරවයෙන් සලකන්න.

# ඉන්ධන හැසිරවීමේදී සහ ගබඩා කිරීමේදී ආරක්ෂිත වන්න

ඔබට ඉන්ධන හැසිරවීමට, ප්‍රවාහනය කිරීමට, හෝ ගබඩා කිරීමට අවශ්‍ය නම්, ඔබ එය ආරක්ෂිතව සිදු කිරීම වැදගත් වේ. අනාරක්ෂිත ලෙස හැසිරවීම, ප්‍රවාහනය කිරීම හෝ ගබඩා කිරීම මගින් ආරක්ෂාව සම්බන්ධ බරපතල අවදානම් උද්ගත විය හැකිය.

වැඩි තොරතුරු සඳහා ඉන්ධන ආරක්ෂිතව හැසිරවීම සහ ගබඩා කිරීම වෙත පිවිසෙන්න.

# දැනටමත් ක්‍රියාත්මක වන සහාය

ඕස්ට්‍රේලියානු රජය විසින් ගෙවැසියන්ට, ප්‍රවාහන ක්‍රියාකරුවන්ට සහ ව්‍යාපාරවලට ඉන්ධන පිරිවැය පීඩනයන් සහ ගෝලීය බාධා කළමනාකරණය කර ගැනීමට උපකාර කිරීම සඳහා සම්බන්ධීකරණය කරන ලද කෙටි- කාලීන සහන පැකේජයක් හඳුන්වා දී ඇත. මෙයට ඇතුළත් වන්නේ:

- ලීටරයකට ශත 32ක් දක්වා ඉතිරියක් ලබා දෙමින් ඉන්ධන වෙනුවෙන් පනවන ලද බද්ද තාවකාලිකව අඩු කිරීම.
- බර වාහන මාර්ග පරිශීලක ගාස්තුව (Heavy Vehicle Road User Charge) අඩු කිරීමක් හරහා භාණ්ඩ ප්‍රවාහන ක්‍රියාකරුවන් සඳහා සහන ලබා දීම.
- ඉතිරිකිරීම් පාරිභෝගිකයින්ට ලැබෙන බව සහතික කිරීම සඳහා ACCC විසින් අධීක්ෂණය කිරීම.
- අමතර සහාය අතරට ඇතුළත් වන්නේ ව්‍යාපාරවලට ඔරොත්තු දීමේ හැකියාව ශක්තිමත් කිරීම සඳහා වේගවත් සහනදායී මූල්‍යකරණය සහ මෙම කාල සීමාව තුළ කුඩා ව්‍යාපාරවලට මුදල් ප්‍රවාහය කළමනාකරණය කිරීමට උපකාර කිරීම සඳහා ඉලක්කගත බදු හා ණය සහනයන් ය.

# අමතර තොරතුරු

- ඕස්ට්‍රේලියානු රජය පෙට්‍රල්, ඩීසල් හෝ ජෙට් ඉන්ධන භාවිතය සම්බන්ධයෙන් කිසිදු සීමාවක් පනවා නොමැත.
- පෙට්‍රල් සහ ඩීසල් මිල ඉහළ යාමත් සමඟ, ඉන්ධන භාවිතය අවම කිරීම සමහර පාරිභෝගිකයින් සඳහා ආර්ථික වශයෙන් සාධාරණ විය හැකිය. පොදු ප්‍රවාහනය, එක් මෝටර් රථයකින් හවුලේ ගමන් කිරීම, බයිසිකල් පැදීම හෝ ඇවිදීම වැනි විකල්ප ප්‍රවාහන ක්‍රම භාවිතා කිරීම, හෝ නිවසේ සිට වැඩ කිරීම මගින් නේවාසිකයන්ට මුදල් ඉතිරි කර ගත හැකිය.
- සමහර පුද්ගලයින්, විශේෂයෙන්ම ප්‍රාදේශීය සහ දුරස්ථ ප්‍රදේශවල සිටින අය, සඳහා, කෘෂිකාර්මික සහ ප්‍රවාහන අංශ සඳහා හෝ අත්‍යවශ්‍ය සේවකයින් සඳහා, සාමාන්‍ය පෙට්‍රල් සහ ඩීසල් භාවිතය පවත්වා ගැනීම ඉතා වැදගත් බව අපි තේරුම් ගනිමු. ඉන්ධන අවශ්‍ය තැනට ලැබෙන බව සහතික කිරීම සඳහා ඕස්ට්‍රේලියානු රජය කර්මාන්ත අංශය සමඟ දිගටම කටයුතු කරයි.
- ඉන්ධන සැපයුම සම්බන්ධ ඕනෑම අපරාධයක් හෝ පොදු ස්ථානවල ආරක්ෂාව පිළිබඳ ගැටළු 000 අංකය ඔස්සේ වික්ටෝරියා පොලිසිය වෙත වාර්තා කළ යුතුය.
- ප්‍රදේශ සඳහා ඉන්ධන සංරක්ෂණය කිරීමට උපකාර කිරීම සඳහා හැකි සෑම විටම පොදු ප්‍රවාහනය භාවිතා කරන ලෙසට වික්ටෝරියානුවන්ව දිරිමත් කරනු ලැබේ.

ඉන්ධන සැපයුම පිළිබඳ යාවත්කාලීන තොරතුරු දැන ගැනීමට, vic.gov.au/fuel-supply වෙත පිවිසෙන්න.